# 2017 මැයි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"එබැවින් ඔබ ගොස්, සකල ජාතීන් ශ්‍රාවකයින් කරන්න.... මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න. ඔවුන්ට උගන්වන්න. මම ද යුගාන්තය දක්වා සදහටම ඔබ හා සමඟ සිටිමි" වදාළ සේක.**

(ශු.මතෙව් 28:19-20)

ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය, උත්ථාන වීම හේතුකොට ගෙන මුළු මිනිස් සංහතියටම ගැළවීම උදා විය. ප්‍රසාද ස්නාපනය නමැති සක්‍රමේන්තුව හා අභිවෘද්ධි ආලේපය නමැති සක්‍රමේන්තුව තුළින් දේව දරුකමේ උරුමයත්, සත්‍යයට සාක්ෂි දැරීමට බලයත් අපට ලැබී ඇත. එබැවින් අපි ඔවුන් වහන්සේට තුති ප්‍රශංසා කරමු.

පුබුදු ජනතාවක් ලෙස මෙම මාසයේ 27 වන සෙනසුරාදා සවස අපගේ වාර්ෂික ශුද්ධාත්ම මංගලෝත්සවය පැවැත්වීමට මේ දිනවල සාංඝිකවල හා ශ්‍රාවක සංඝවල දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභිමුව පුබුදු ජනතාව අඛණ්ඩ යැදුමෙන් සමිඳුන් අභියස පෙනී සිටිති. අයැදීමේ සේවකයන් වශයෙන් අපිත් ඊට දායක විය යුතුමය.

එමෙන්ම ඒ ශුද්ධවූ රාත්‍රියේදී වැගිරෙන ශුද්ධාත්ම බලය අප පුබුදු සංඝය වෙතත්, අප ශුද්ධවූ සභාව වෙතත්, අප දේශය හා සමස්ථ ලෝකය වෙතත් ගලා යන්න කියා අපි නිරන්තරයෙන්ම අයැදිමු.

අද මාසික සුපුවත තුළ ජේසු ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගාරෝහණයට පෙර තම ශ්‍රාවකයින්ට ප්‍රකාශ කළ බලගතු වචනය වන "සකල ජාතීන් මාගේ ශ්‍රාවකයින් කරන්න" යන වදන ඔස්සේ අයැදීමේ සේවකයන් වශයෙන් මේ මාසය පුරාවටම ශ්‍රී ලංකාව පුරා මෙන්ම සමස්ථ ලෝකය පුරා ජීවත් වෙන ජනතාවට මරණයෙන් උත්ථාන වූ ජේසු ක්‍රිස්තුන් වහන්සේව අත්දකිමින් හමුවෙමින් දේව ප්‍රේමය ගැඹුරින් අත්දකින්නටත්, ඔවුන් වහන්සේව අන් අයට ප්‍රකාශ කරන්නත්, සාක්ෂි දැරීමටත් බලය ලැබේවා යි අයැදිමු.

ඔබ ජේසුස් වහන්සේ සමිඳාණන් වහන්සේ යයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නෙහි නම්, දෙවියන් වහන්සේ ඔවුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ බව සිතින් අදහන්නෙහි නම්, ඔබ ගැළවීම ලබන්නෙහිය. (රෝම 10:9)

පළමු සතිය - දිව්‍යමය කියවීම - ශු.මතෙව් 28:16-20

අයැදීමට විශේෂ යොමුව :

ඉදිරියේ පැවැත්වීමට සූදානම්ව සිටින ශුද්ධාත්ම මංගල්‍යය හේතු කොටගෙන එදින ඊට සහභාගි වන පුබුදු ජනතාව සහ සියළුම ගිහි, පැවිදි පූජකයන් තුළ ශුද්ධාත්ම බලය බලගතුව අත්දකින්නට ලැබෙන මෙන් යාච්ඤා කරන්න. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා වෙනුවෙන්
* දිවැසි එකතුව,සහයක එකතුව, සුසුමත එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්
* වෙනත් අයැදීම් .......

දෙවන සතිය - දිව්‍යමය කියවීම - රෝම 10:9-15

අයැදීමට විශේෂ යොමුව :

නාමික ක්‍රිස්තියානි කාරයන් මෙන්ම ජේසු ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ සත්‍යතාවය පිළි නොගන්නා ජනතාව වෙනුවෙන් සහ මිත්‍යා විශ්වාසයේ ඇලී ගැලී නොමඟ ගොස් සිටින ජනතාව වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ශුද්ධෝත්තම පියතුමා ඇතුළු පූජක, පැවිදි සහ ධර්මදූත සේවාවේ යෙදෙන සියළු දෙනා වෙනුවෙන්.

* වෙනත් අයැදීම්.......

"ඔබවහන්සේගේ ශුද්ධවූ කැමැත්ත පමණක් අපට හෙළි කළ මැනව"

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

*****************************